# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2151/2 - 2019 නොවැම්බර් මස 25 වැනි සඳුදා - 2019.11.25**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:*කොප්‍රාලේ/ඉඅත්/3/20/එන්එච්.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*:* එල්/03/96/එන්එච්/382.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (කොට්ඨාස අංක 25 කොළඹ මහ නගර සභා සීමාව තුළ) පංචිකාවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක 9823 හා 2019.06.20 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1-2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1166ක පමණ වන වරිපනම් අංක 175/40, 191/20 සහ තවත් හාජියාර් සාහීර් කාසිම් පෙදෙස.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: වරිපනම් අංක 175/40, 191/20 සහ තවත් සාහීර් කාසිම් හාජියාර් පෙදෙස; මුල් හිමිකම් පාන්නා: රජය;හිමිකම් කියන්නා: රජය, ගෙවත්ත, දෙමහල් ස්ථිර ගොඩනැගිලි 02 ක් ඇත.ඩබ්.ටී.හේමරත්න, සිත්ති සුලෙයිනා, සහ තවත් අය පරිහරණය කරයි;ප්‍රමාණය: හෙක්. 0.0905.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: වරිපනම් අංකය නැත; මුල් හිමිකම් පාන්නා: රජය;හිමිකම් පාන්නා: සොයාගත නොහැකය;වර්තමාන පරිහරණය: මාර්ගය; ප්‍රමාණය: හෙක්. 0.0261.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2019 දෙසැම්බර් මස 06 වැනි දින පෙ.ව. 10.00ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2019 නොවැම්බර් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරයක්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී.පී.වික්‍රමසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2019 ඔක්තෝබර් මස 04 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වෙල්ල වීදිය, කොළඹ - 12.

12 - 297